# 'ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය පිළිබඳ මහජන අදහස් විමසීමේ කමිටුව' විසින් සම්පාදිත වාර්තාව පිළිබඳ මහජන සංවාදය - වාර්තාව



**දිනය :**
**2016-07-08 සහ 09**

**වේලාව :**
**පෙ.ව 9.30/ප.ව 3.00**

**ස්ථානය :**
**කෑගල්ල හේෂානි හෝටලය**
**කුරුණෑගල අග රදගුරු මන්දිරය**


ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වෙනසකට පුරවැසි ප්‍රයත්නය
அரசியலமைப்பு மாற்றத்திற்கான பிரஜைகளின் முயற்சி
Citizens' Initiative for Constitutional Change

# හැඳින්වීම:

නීතිඥ ලාල් විජේනායක මහතාගේ ප්‍රමුඛත්වයෙන් 'ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය පිළිබඳ මහජන අදහස් විමසීමේ කමිටුව' දිවයිනේ සියලු ප්‍රදේශ ආවරණය වන පරිදි මහජන අදහස් හා යෝජනා ලබාගත් අතර එම මහජන අදහස් හා යෝජනා සහ කමිටු නිර්දේශ ඇතුළත් වාර්තාව ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සම්පාදන මණ්ඩලයට බාර දී ඇත.



ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ කථිකාව ආරම්භයේ සිට ම ඒ ගැන කැපවීමෙන් ක්‍රියා කළ එකමුතුවක් හැටියට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වෙනසකට පුරවැසි ප්‍රයත්නයේ අදහස වූයේ එම කමිටු වාර්තාව පිළිබඳ සංවාදයක් ඇති කළ යුතු බවයි. ඒ අනුව දිවයිනේ විවිධ ප්‍රදේශ ආවරණය වන පරිදි අදියර කීපයක් යටතේ එකී සංවාදයන් පැවැත් වීමට අදහස් කළෙමු.

පළමු අදියරේ සංවාද ද්විත්වයක් කෑගල් සහ කුරුණෑගල යන නගරවලදී පැවති පැවැත් විණි. **2016.07.08 දින උදෑසන කෑගල්ල හේෂානි හෝටලයේ දී සහ 2016.07.09 දින සවස කුරුණෑගල අග රදගුරු මන්දිරයේ (බිෂොප් හවුස්) දී** එකී මහජන සංවාද පැවැත් විණි.

මෙම සංවාද සඳහා නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනුවෙන් අදහස් හා යෝජනා ලබා දුන් පුරවැසියන් පැමිණ සිටි අතර නීතිඥ එස්.ජී. පුංචිහේවා සහ ලයනල් ගුරුගේ යන මහත්වරුන් මූලික දේශනයන් සිදු කරන ලදී.

කුරුණෑගල සංවාද සඳහා 'ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය පිළිබඳ මහජන අදහස් විමසීමේ කමිටුවේ සභාපති නීතිඥ ලාල් විජේනායක මහතා සහභාගී විය.

මෙම සංවාදයන් හි පුරවැසියන් තමන්ගේ යෝජනා කමිටුවාර්තාවට ඇතුළත් වීම සම්බන්ධයෙන් සාධනීය ප්‍රතිචාර දක් වූ අතර ඇතමුන් කියා සිටියේ ඔවුන්ගේ යෝජනා ඇතුළත් ව නොමැති බවයි. කෙසේ හෝ වඩාත් යහපත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් නිර්මාණය කර ගැනීම සඳහා කමිටු නිර්දේශ ව්‍යවස්ථාවට ඇතුළත් කර

ගැනීම සම්බන්ධයෙනුත්, වාර්තාවට ඇතුළත් ව නොමැති යෝජනා ඇතුළත් කර ගැනීම සම්බන්ධයෙනුත් දීර්ඝ ලෙස සාකච්ඡා කෙරුණි.

මෙම සංවාදවලදී පුරවැසියන් මතු කළ අදහස් හා යෝජනා අතර සාධනීය ප්‍රගතිශීලි අදහස් මෙන්ම යම් අන්තවාදී අදහස් සහිත නිශේධනීය අදහස් සහ යෝජනාද විය. ඒවාට විද්වත් සභාව පිළිතුරු සැපන ලදී. ඇතම් අවස්ථාවල සංවාදයන් වඩාත් උණුසුම් විය.

එහිදී විද්වතුන් සහ පැමැණි සිටී පුරවැසියන් දක් වූ අදහස් යෝජනා සැකවින් මෙහි දක්වා ඇත.

# ලයනල් ගුරුගේ



ලයනල් ගුරුගේ මහතා මුලින් ම මෙම සංවාදයේ අරමුණ පැහැදිලි කරන ලදී. එහිදී ප්‍රථයෙන් ම ව්‍යවස්ථාව පිළිබඳවත් අලුත් ව්‍යවස්ථාවක අවශ්‍යතාව ගැනත් ඔහු කරුණු පැහැදිලි කළේ ය.

එසේ ම ව්‍යවස්ථා ඉතිහාසය පිළිබඳ කරුණු දක් වූ ලයනල් මහතා 1931 ඩොමොර් ව්‍යවස්ථාව, සෝල්බරි ව්‍යවස්ථාව ආදී ව්‍යවස්ථා සහ ඒවා නිර්මාණය වූ ආකාරය පිළිබඳ පැදිලි කළේ ය. ඔහු තවදුරටත් මෙසේ අදහස් දක්වී ය.

'මාගේ පුද්ගලික විශ්වාසය අනුව සෝලබරි ව්‍යවස්ථාව යහපත් එකකි. 72 ව්‍යවස්ථාව ඉන් පසුව නිර්මාණය විය. එහිදී මේ ආකාරයට පුරවැසි ඇදහස් ලබා නොගත්තේ ය. එහි දී ව්‍යවස්ථා සභාව හැටියට පාර්ලිමේන්තුවම පෙනී සිටිමින් ව්‍යවස්ථාව නිර්මාණය කළේ ය. එහි සභාපති වූයේ කොල්වින් ආර් ද සිල්වා ය. එහිදී සිදු වූ යහපත් දෙයක් වන්නේ නිදහස ලැබීම ය. අග්‍රාණ්ඩුකාරවරයා වශයෙන් ටී විලියම් ගොපල්ලව මහතා එහිදී නාමික විධායකය බවට පත් විය. මෙම ව්‍යවස්ථාවේදී එකට සිටී පෙඩරල් පක්ෂය ආණ්ඩුවෙන් පිටමන් විය. 1977 ජේ.ආර්. ජයවර්ධන මහතා ඔහුගේ ප්‍රතිපත්ති ප්‍රකාශනේයේ දී සියලු ම දේශපාල පක්ෂ සමඟ එක්ව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් නිර්මාණය කරන බවට පොරොන්දු විය. ඒ සඳහා ඔහුට හයෙන් පහක බලයක් හිමි විය. ඒ බලය ප්‍රයෝජනයට ගනිමින් සිය සහෝදරයා ලවා ඔහු ව්‍යවස්ථාව නිර්මාණය කළේය. අප තිස් අට අවුරුද්දක් තිස්සේ භුක්ති විඳින්නේ එකී ව්‍යවස්ථාවයි. තරුණ කැරලි, තිස් වුරුදු යුද්ධයකට පසුව නැවතත් ව්‍යවස්ථාවක් නිර්මාණය කිර ගැනීමේ අවස්ථාව උදා වී තිබේ. ඒ සඳහා ආණ්ඩුව එකඟත්වය පළ කර තිබේ. ඒ අනුව මෙරට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් නිර්මාණය කිරීමේ දී මහජන අදහස් ලබා ගත යුතු යැයි ප්‍රථම වරට යෝජනා වී තිබේ.'



තව දුරටත් අදහස් දක් වූ ලයනල් මහතා, නව ව්‍යවස්ථාව සඳහා මහජන අදහස් ලබා ගැනීමේ කමිටුවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ ව ද පැහැදිලි කළේ ය. එසේම මේ වන විට මහජන අදහස් හා යෝජනාවලින් සමන්විත වාර්තාව එළිදක්වා ඇති බවත්,

ඇතැම්වුන් තමන් කී කාරණා වාර්තාවේ නැතැයි චෝදනා කළත් ව්‍යවස්ථාවකට එසේ හැම දෙයක්ම එකතු කළ නොහැකි බවත් ඔහු සඳහන් කළේ ය. එසේ ම සමර විෂයන් සම්බන්ධයෙන් එක් වාක්‍යක් පමණක් ඇතුළත් කළ ද එහි මනා ජීවගුණයක් රැඳී ඇති බව ද ව්‍යවස්ථාවට එකතු වී නැති කාරණා එකතු කිරීමේ හැකියාව ඇත්නම් එය වඩාත් සාධනීය තත්ත්වයක් බව ද අවධාරණය කළේ ය.

ආණ්ඩුව, මෙම ව්‍යවස්ථා සම්පාදන කාර්යයේ දී  ජාතික මෙහෙයක් කොට එය නොසැළකූ බව සඳහන් කළ ලයනල් මහතා ලංකාවේ පුරවැසියන්ගේන් සියයට අනූවක් පමණ නව ව්‍යවස්ථාවක් සම්පාදනය වන බව නොදන්නා බව ද ඒ සඳහා පුරවැසි අදහස් ගත් බව නොදන්නා බවද සඳහන් කළේ ය. මේ සඳහා මාධ්‍ය ආයතනවල දායකත්වය ලැබුණේ අවම වශයෙන් බව ද ඔහු පකාශ කළේ ය. එසේ ම කෝටි දෙකක් පමසණ සිටින ජන ගහනයෙන්  මේ වාර්තාව සඳහා අදහස් ලබාගෙන ඇත්තේ තුන්දහස් පන්දියයක් වැනි ප්‍රමාණයකින් පමණක් බවත්, මෙය ජාතික ව්‍යාපරයක් වශයෙන් සිදු නොවුණායැයි පවසන්නේ ඒ නිසා බවත් ලයනල් මහතා ප්‍රකාශ කළේ දකුණු අප්‍රිකාව, කෙන්යාව වැනි රටවල ව්‍යවස්ථා සම්පාදනයන් සිදු වුණු ආකාරයන් පිළිබඳ ව ද උදාහරණ සහිතව පැහැදිලි කරමිනි.



අවසන් වශයෙන් අදහස් දක් වූ ලයනල් මහතා කීයේ, දැන් ව්‍යවස්ථාව සඳහා පුරවැසි අදහස්වලින් නිර්දේශයන් සකස් කර ඇති බවත්, සක්‍රිය පුරවැසියන් වශයෙන් මේ අවස්ථාවේදී නැගී සිටිය යුතු බව කීවේ ය.

පක්ෂ අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය වැනි කාරණා මෙම වාර්තාවේ ඇතුළත්ව නැති බවත්, එක් එක් විෂයන් සම්බන්ධයෙන් පුරවැසියන් කොපමණ ප්‍රමාණයක් යෝජනා ලබා දුන්නාද යන්න නිශ්චිතව දක්වා නොමැති බවත් ඔහු සඳහන් කළේ ය. නමුත් මානව හිමිකම් සම්බන්ධයෙන් ඉතා ප්‍රබල කාරණා දක්වන බවත්, ඇතැම් අඩුපාඩු තිබුණ ද වඩාත් හොඳ ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම සඳහා අවැසි අවකාශය මෙම කමිටු වාර්තාව ඔස්සේ සකස් කර ඇති බව තමා විස්වාස කරන බවත්, දැන් පුරවැසියන් වශයෙන් ව්‍යවස්ථාවට අදහස් යේජනා ලබා දී බලා සිටිය නොහැකි බවත් ඔහු සඳහන් කළේ ය.

පහු ගිය කාලයේ විවිධ පනත් සම්මත් සම්මත වුවද ඒ පිළිබඳ ජනතාවගේන් තොරතුරු නොවිමසූ බවත්, තොරතුරු දැනගෙනීමේ පනත සහ ඖෂධ පනත වැනි පනත් සකස් වුයේ එසේ බවත් ඔහු කරුණු සහිතව විස්තර කළේ ය.

භාෂා ප්‍රතිපත්තිය ගැනත්, පාරිභෝගික අයිතිවාසිකම් ගැනත් සඳහන් කර ගුරුගේ මහතා කියා සිටයියේ එවැනි වඅස්ථාවලදී පුරවැසියාට අසාධාරණකම් සිදු වන්නේ නම් ඒ වෙනුවෙන් නැගී සිටිය යුතු බවයි. භාෂාව සම්බන්ධයෙනුත්, පාරිභෝගික

අයිතිවාසිකම් සම්බන්ධයෙනුත් ඔහු ගොනුකර ඇති නඩු කිහිපයක් පිළිබඳ කරුණු දක්වමින් ඒ පිළිබඳ වැඩි දුරටත් ප්‍රකාශ කළේ ය.

අවසන් වශයෙන් ඔහු අවධාරණය කළේ යහපත් අයුරින් නව ව්‍යවස්ථාව සම්පාදනය කර ගැනීම සඳහා පුරවැසියන් සක්‍රියව දායක වෙමින් ව්‍යවස්ථා සම්පාදන මණ්ඩලයට මෙම නිර්දේශයන් ලබා ගන්නැයි බලපෑම් කළ යුතු බවයි.



# නීතිඥ එස්.ජී. පුංචිහේවා

නව ව්‍යවස්ථාව මසඳහා මහජන අදහස් විමසීමේ තමිටු වාර්තාවේ වඩාත් වැදගත් නිර්දේශයන් පිළිබඳ විග්‍රහ කිරීම පුංචිහේවා මහතාගේ අරමුණ විය. එහිදී ඔහු වර්තමනායන වන විට ලෝකයේ දියුණු අයුරින් සම්පාදිත දකණු අප්‍රිකානු සහ කෙන්යානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පිළිබඳව හැඳින්වීමක් කරමින් එම ව්‍යවස්ථාවන් සඳහා යුරෝපීය රටවල (නොර්වේ, ස්වීඩන්, ස්කැන්ඩිනියා) ව්‍යවස්ථාවල ඇති ඉතා දියුණු මානව අයිතිවාසිකම් ඇතුළු ප්‍රජාතන්ත්‍රවාදී ලක්‍ෂණ ඇතුළත්ව ඇති බව ඔහු සඳහන් කළේ ය.

මෙම යෝජනා සහ නිර්දේශ ව්‍යවස්ථාවට ඇතුළත්වීම සම්බන්ධයෙන් ප්‍රධාක කාරණා දෙකක් කෙරෙහි ඔහු අවධාරණය යොමු කළේ ය. පළමු වැන්න වන්නේ  මෙම යෝජනා සහ නිර්දේශ ව්‍යවස්ථාවට ඇතුළත් වේවිද යන ගැටලුව ඇති බවත් ඒ වෙනුවෙන් මහජනයා පෙලගැසී සිටිය යුතු බවත් පුංචිහේවා මහතා සඳහන් කළේ ය. ජනතා නියෝජිතයින් හැටියට පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරු පත් කර යවා තිබණද මෙම වටිනා නිර්දේශ ව්‍යවස්ථාවට ගන්නැයි ඔවුන්ට බලකළ යුතු බව ඔහු තවදුරටත් කියා සිටියේ ය. දෙවැනි කාරණය වශයෙන් ඔහු වඅධාරණය කළේ දියුණු ව්‍යවස්ථා වශයෙන් හඳුන්වපු දකුණු අප්‍රිකානුව සහ කෙන්යා ව්‍යවස්ථාවල භාවිතයේ දී දුර්වලකම් ඇති බවත් ඒ නිසා මෙම නිර්දේශ ව්‍යවස්ථාවට ඇතුළත් වුවද ඒවා ක්‍රියාත්මක වීම පිළිබඳී සැළකිලිමත් විය යුතු බවයි. මේ සඳහා ඉන්දියානු ව්‍යවස්ථාවේ ඇති වගන්තියක් ද ගෙනහැර දක්වමින් ඔහු වැඩි දුරටත් පැහැදිලි කළේ ය. ඉන්දියානු ව්‍යවස්ථාවේ 32 ව්‍යවස්ථාවේ ජීවිතයට ඇති අයිතිය පිළිබඳ ඇති බවත්, එය පුළුල් ලෙස විග්‍රහකර ඇති බවත් එම නීතිය තිබියෙදීම ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ඇති බවද ඒ නිසා ඕනම වෙලාවක එම ත්‍රස්තවාදය වැළැක්වීමේ නීතිය යටතේ මිනිසුන් වෙඩි තියා ඝාතනය කරන බවද සඳහන් කළේ ය. ව්‍යවස්ථාවේන යම් අයිතියක් ආරක්‍ෂා කළළ ද එය කඩවන නීති තිබුණ හොත් ව්‍යවස්ථාව කඩ වෙන බවද මෙවැනි වඅස්ථාවලදී පුරවැසියන් නැගී සිටිය යුතු බව ද සඳහන් කළේ ය.

මහජන අදහස් විමසීමේ කොමිසම සහ එහි ඉතිහාසය පිළිබඳ යම් අදහසක් දැකවූ පුංචිහේවා මහතා තවදුරටත් පැවසුවේ කොමිසමේ අදහස්වලට වඩා මහජනයාගේ අදහස්වලට ඉඩදී ඇති බවත්, අන් කොමිසම්වලට වඩා මේය පුළුල් කොමිසමක් බැවින් හැම යෝජනාවකට ම එකඟ වීමට ද නොහැකි වී ඇති බවත් ය. එසේ ම මෙහි අති සියලු යෝජනා ගන්නේ නම් දකුණු අප්‍රිකාව සහ කෙන්යාවේ ව්‍යවස්ථා තරමට ම සාර්ථක ව්‍යවස්ථාවක් මෙරටේ තැනිය හැකි බවත් එසේ සිදු

වේවිද යන ප්‍රශ්න ඇති බවත් පැවසූ එස්.ජී මහතා මෙය මජනතාවට ඉදිරිපත් කළ වාර්තාවක් ලෙස සළකා මෙහි යෝජනා ව්‍යවස්ථාවට නොගන්නේ නම් ඒ පිළිබඳ ප්‍රශ්න කළ යුතු බව අවධාරණය කළේ ය.



වාර්තාව දීර්ඝ එකක් බැවින් එහි ස්ථාන කීපයකින් ගත් කරුණු පිළිබඳ ඔහු සාකච්ඡා කළේ ය.

- බලතල බෙදීම

නිර්දේශය "බලතල බෙදීම පිළිබඳ සිද්ධාන්තය, හුදු අර්ථය නොව, එහි අගය හා ජීව ගුණය සලකා ව්‍යවස්ථා සම්පාදනයේ දී අවධානය යොමු කළ යුතුවේ.

- පළාත් පාලනය

පවතින මහ නගර සභා, නගර සභා, ප්‍රා.සභා වලට අමතරව ගම් මට්ටමේ ග්‍රාමීය ජන සභාවක් පිහිටුවීම, පළාත් පාලන ආයතන වල කටයුතු වල්දී උපදේශක හා අධීක්ෂණ කාර්යක් සඳහා ග්‍රාමීය ජන සභාවලට බලය තිබිය යුතුය.

වතුවල මානව ජනාවාස ගම් පද්ධතියේ කොටසක් ලෙස ප්‍රකාශ කර ගම් සභා, සුළු නගර සභා නාගරික සභා හා මහනගර සභාවල කොටසක් කිරීම නිර්දේශ කෙරේ.

- නියාමක මූලධර්ම

වෙළඳපොළ හා රාජ්‍ය පද්ධති වලට විකල්පයක් ලෙස සමූපකාර ක්‍රමය රජය පිළිගත යුතු අතර සමූපකාර ව්‍යාපාරය ප්‍රචලිත කිරීමට කටයුතු කරමින් ඊට දේශපාලන මැදිහත්වීම වැළැක්විය යුතුය.

වැඩ පොළේ මූලික අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ප්‍රඥප්ති වල සඳහන් කම්කරු අයිතිවාසිකම් රජය ආරක්ෂා කළ යුතුය.

- රජය අත්සන් කළ ජාත්‍යන්තර ප්‍රඥප්ති ; සම්මුති හා ගිවිසුම් ඒවා අත්සන් කිරීමෙන් අවුරුද්දක් ඇතුළත නීතිගත කිරීමට සහතික වීම රාජ්‍යයේ වගකීම වෙයි.

  මෙම පරිච්ඡේදයේ අඩංගු ප්‍රතිපාදන කිසිම උසාවියක හෝ අධිකරණයක බලාත්මක කළ හැකි නොවේ.

කමිටු වාර්තාවේ සඳහන් ඉහත කාරණා සම්බන්දයෙන් පැහැදිලි කිරීමක් කළ පුංචිහේවා මහතා මීට අමතරව එහි සඳහන් මූලික අයිතිවාසිනම් පිළබඳ පහත කාරණා පිළිබඳව ද අදහස් දක්වී ය.



- මූලික අයිතිවාසිකම්
  - ජීවිතයට ඇති අයිතිය
  - සමානාත්මතා නීතියට අමතරව - අසමාන ලෙස සැලකීම පිටු දකීමේ කොමිසමක් පත් කළ යුතුය.
  - කමිටු වාර්තාවේ නිර්දේශ පවතින ව්‍යවස්ථාවේ 12(2) ව්‍යවස්ථාවට වඩා පුළුල්ය.
  - "ජාතිය, ආගම, කුලය, වෛවාහක තත්වය, මාතෘභාවය, වයස, භාෂාව, කායික හෝ මානසික දුබලතාව, ගැබිනි බව, සිවිල් තත්වය, වැන්දඹු වීම, සමාජ සම්භවය, ලිංගිකත්ව නැඹුරුව, ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජ භාවය - වෙනස් ලෙස නොසැලකිය යුතුය.
- පුද්ගලයකුගේ අයිතිවාසිකමක් හෝ මූලික නිදහසක් කෙරෙහි පරිපාලන ක්‍රියාවක් නිසා අහිතකර බලපෑමක් ඇති වේ නම්. එම ක්‍රියාව සඳහා හේතු ලිඛිතව ලබා ගැනීම එම පුද්ගලයාට අයිතියක් තිබේ.
- සෞඛ්‍යයට ඇති අයිතිය
  - ආහාර, ජලය හා සමාජ ආරක්ෂාව
  - ආහාර සුරක්ෂිතතාව, ආහාර ස්වාධීනත්වය
  - ප්‍රමාණවත් ආහාර, ජලය, ඇඳුම් හා නිවාස
  - කුසගින්නෙන් තොරව සිටීමේ අයිතිය සමාජ ආරක්ෂාව - සමාජ රක්ෂණය
- අධ්‍යාපන අයිතිය
- ඉඩම් අයිතිය
- පරිසරය ආරක්ෂා කිරීම
- වැඩ කිරීමට, රැකියාවට හා ජීවනෝපායට අයිතිය

- වෘත්තීය සමිති අයිතිවාසිකම්
- ජාත්‍යන්තර වෙළඳ ගිවිසුම් විදේශීය ආයෝජකයන් දේශීය නීති නොතැකීම
- කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු අයිතිවාසිකම් රැකීමේ දී අසාර්ථක බව
- දේපළ හා ඉඩම් අයිතිය
- සෑම පුද්ගලයකුටම, භාවිතය, මාරු කිරීම, පරිපාලනය, පාලනය, අයිතිය අත්පත් කර ගැනීම, කළමනාකරණය, බුක්තිය, පැවරීම, උරුමය - සම්බන්ධ සමාන අයිතිවාසිකම් තිබිය යුතුය.
- උසාවියෙන් ලබාගත් නියෝගයක් මත නීතියෙන් ඉඩදී ඇති ආකාරයට හැර කිසිම පුද්ගලයකුගේ නිවසක් කඩා බිඳ නොදැමිය යුතුය. නිවසෙන් ඉවත් නොකළ යුතුය.
- රාජ්‍ය රැකියාවල සාධාරණත්වය හා සමාන අවස්ථා
- අතුරුදහන් නොවීමේ අයිතිය
- තොරතුරු ලබා ගැනීම
- යුක්තිය සඳහා අයිතිය
- ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ අයිතිවාසිකම්
- පාරිභෝගික අයිතිවාසිකම්
- තිරසාර සංවර්ධනය හා ශුභසාධනයට අයිතිය
- විවිධ ලිංගික අනන්‍යතා සහිත ජනයාගේ අයිතිවාසිකම්

➢ නිර්දේශ

- අධිකරණ ක්‍රියාදාමයකින් මූලික අයිතිවාසිකම් කඩවූ අවස්ථාවකදී අධිකරණය ද වගකීමට යටත් විය යුතුය.
- පුද්ගලික ආයතන විසින් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කළ විට එය අධිකරණයේ අභියෝග කළ හැකි විය යුතුය.
- මූලික අයිතිවාසිකම් නඩු පැවරීමට ඕනෑම පුද්ගලයකුට හෝ කණ්ඩායමකට හැකි විය යුතුය.
- නිර්දේශ මූලික අයිතිවාසිකම් අයදුම්පතක් ඉදිරිපත් කිරීමට කාල සීමා මාස තුනක් දක්වා දීර්ඝ කළ යුතුය.
- උචිත අවස්ථාවන්හි අවිධිමත් අයදුම්පතක් හෝ පිළිගත යුතුය.

ඉහත සඳහන් අයුරින් මූලික අයිතිවාසිකම් සම්බන්ධයෙන් කමිටු වාර්තාවේ සඳහන් යෝජනා හා නිර්දේශ පිළිබඳ විග්‍රහයක් ඉදිරිපත් කළ පුංචිහේවා මහතා එම නිර්දේශ නව ව්‍යවස්ථාවට ඇතුළත් කිරීමේ වැදගත්කම පිළිබඳව සඳහන් කළේ ය. එසේ ඇතුළත් නොවන්නේ නම් පුරවැසියා ඒ වෙනුවෙන් පෙනී සිටිය යුතු බව ද අවධාරණය කළේ ය.

# පුරවැසි අදහස් සහ යෝජනා

- 71,89 තරුණ කරළි සහ තිස් අවුරුදු යුද්ධයක් ඇති වීමට හේතු වූ කාරණා පිළිබඳ පසු විපරමක් කොට එවැනි දේවල් ඇති වූයේ ඇයිදැයි විමර්ශනය කොට එවැනි දෑ නැවතත් ඇති නොව න අයුරින් ව්‍යවස්ථාව සම්පාදනය කළ යුතු වීම.
- සුනාමි, නාය යෑම් වැනි ආපලදා අවස්ථාවලදී උපකාර ලැබීමට ඇති අයිතිය මානව මිහිකමක් ලෙස පිළිගත යුතු ය.
- අනාගමික පුද්ගලයෙකුගේ අයිතීන් ව්‍යවස්ථාවෙන් තහවුරු කළ යුතු ය.
- අඳ ගොවි පනත ශක්‍ති්මත් කළ යුතු ය.
- ව්‍යවස්ථාවේ වගන්ති වැඩිවීම ගැටලු සහගත දෙයකි.
- ආගම සහ රාජ්‍යයේ ස්වභාවය යන කාරණවලදී රටේ දේශපාලනඥයින් කෙසේ කටයුතු කරාවිද යන්න කෙරෙහි සැලකිලිමත් විය යුතු ය.
- අධිකරණයේ සිංහල සහ දෙමළ යන භාෂා දෙකෙන් ම නඩු ඇසිය යුතු ය.
- රාජ්‍ය සේවකයින්ගේ ද්වි භාෂාහැකියාව උරගා බැලීම වෙනුවෙන් පවත්වන කඩඉම් විභාගය නතර කළ යුතු ය.
- මීට අමතර ව සිංහල බෞද්ධ නායකයකු මෙරට රාජ්‍ය නායකයකුවීම, සිංහල දේශය, සිංහලේ වැනි නම් වින් මෙරට හැඳින් විය යුතු වීම සහ රාජ්‍ය ආගම බුද්ධාගම ලෙස පවත්වා ගැනීම වැනි යෝජනාද පළ විය.

